# ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශය
# ලංකා ධීවර සංස්ථාව
## පුරප්පාඩු

ලංකා ධීවර සංස්ථාවේ පුරප්පාඩුව පවතින පහත සඳහන් තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

**සේවා ගණය** : කළමනාකාර

**තනතුර :** කළමනාකාර/ ජ්‍යෙෂ්ඨ කළමනාකාර (මානව සම්පත් සංවර්ධන) **(MM 1-1& -01)**

**සුදුසුකම්:**

**බාහිර අපේක්ෂකයින්**

1. විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව පිළිගත් කළමනාකරණය/ මානව සම්පත් කළමනාකරණය / රාජ්‍ය පරිපාලනය පිළිබඳ උපාධියක් ලබා තිබීම.

   සහ

2. රාජ්‍ය ආයතනයක / සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක / ආයතනයක / පිළිගත් වාණිජ ආයතනයක පළමු වන උපාධිය ලබා ගැනීමෙන් පසු මානව සම්පත් සංවර්ධන / පරිපාලන කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර එකක (01) පළපුරුද්දක් ලබා තිබීම.

**අභ්‍යන්තර අපේක්ෂකයින්**

1. ඉහත සඳහන් බාහිර අපේක්ෂකයින් සඳහා වන සුදුසුකම් ලබා තිබීම.

2. කණිෂ්ඨ කලමනාකරණ සේවා ගණයෙහි (JM 1-1) II වන ශ්‍රේණියේ මානව සම්පත් සංවර්ධන / පරිපාලන/ විනය කටයුතු පිළිබඳව අවම වශයෙන් වසර පහක (05 )ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

වැටුප: **MM 1-1- 2025 Rs. [91690 – 10x2480– 15 x3450-168240]**
**(රජය විසින් වරින් වර නිකුත් කරනු ලබන චක්‍රලේඛ ප්‍රකාරව අනෙකුත් දීමනා (ජීවන වියදම් දීමනාව, චක්‍රලේඛ ප්‍රකාරව වෘත්තීය දීමනාව) හිමි වේ.**

වෙනත් ප්‍රතිලාභ:

1) සේවක අර්ථසාධක අරමුදල් වෙනුවෙන් වැටුපෙන් අඩු කර ගන්නා 10% දායක මුදල සඳහා සංස්ථාව මගින් 15% දායක මුදල් බැර කරනු ලැබේ'
2) සේවක භාරකාර අරමුදල සඳහා සංස්ථාව 3% l ප්‍රදානයක් බැර කරනු ලැබේ.'
3) රජයේ චක්‍රලේඛ අනුව ප්‍රවාහන පහසුකම් හෝ දීමනා හිමි වේ.

පොදු කොන්දේසි:

(අ) අපේක්ෂිතයින්ගේ වයස අවු: 22 ට නොඅඩු හා 45 ට නොවැඩි විය යුතුය.
(අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වයස් සීමාව අදාල නොවේ)
(ආ) රාජ්‍ය ආයතනයක/ සංස්ථාවක / ව්‍යවස්ථාපිත මණ්ඩලයක අයදුම්කරුවන් ස්වකීය අයදුම්පත් අදාල ප්‍රධානීන් මාර්ගයෙන් යොමු කළ යුතුය.
ඇ) ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
(ඈ) තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
(ඉ) විශිෂ්ට චරිතයකින් යුක්ත විය යුතු වේ.

සුදුසුකම් හා පළපුරුද්ද පිළිබඳ ජීව දත්ත තොරතුරු (CV) හා අදාල අධ්‍යාපන සුදුසුකම් හා පළපුරුද්ද පිළබඳ සහතිකපත් ද සමග ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් ලිපිනයන් සහ දුරකථන අංකයන් සහිතව **2026.10.12** දිනට හෝ ඊට ප්‍රථම තනතුරේ නම ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ පැහැදිලිව සටහන් කර මා වෙත ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.
(Email: chairman@cfc.gov.lk )

සභාපති
ලංකා ධීවර සංස්ථාව
නො 15, රොක් හවුස් පටුමග
කොළඹ 15.
දුරකථන අංක (0112-540455)

Gazette.lk SINCE 2014 AMBITIONS REALIZED